සිංහල රීතිය - 7

# පද නිර්මාණය

දේශමාන්‍ය
සාහිත්‍ය සූරි
සම්මානිත මහාචාර්ය

**ජේ. බී. දිසානායක**

කොළඹ විශ්වවිද්‍යාලය

(C) Sumitha Publishers

සුමිත පොතක්

සිංහල රීතිය - 7

# පද නිර්මාණය

ප්‍රථම මුද්‍රණය   2014

© ජේ. බී. දිසානායක

**ISBN 978-955-0335-61-9**

කවරය
සමන් සිරිවර්ධන

පිටු සැකසුම
තාගයා ගමගේ

(C) Sumitha Publishers

ප්‍රකාශනය:

**සුමිත ප්‍රකාශකයෝ**
info@sumithabooks.com
www.sumithabooks.com
දුරකථනය: 0777 80 96 76

මුද්‍රණය:

SRIDEVI

**ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.,**
27, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල
දුරකථනය : 2716709

# පෙර වදන

'පද නිර්මාණය' නමැති මේ පොත 'සිංහල රීතිය' නමැති පොත් පෙළේ හත්වැන්න යි. මීට පෙර පළ වුණු කාණ්ඩවල අරමුණ වූයේ 'සිංහල අක්ෂර විචාරය' කෙරේ අවධානය යොමු කිරීම යි. ඒ අනුව සිංහලයෙහි එන ශබ්ද, අක්ෂර, අක්ෂරාණු, සන්ධි විධි හා අක්ෂර වින්‍යාසය පිළිබඳ කරුණු ඒවායෙහි දැක්විණ.

මෙතැන් සිට අවධානය යොමු වන්නේ 'සිංහල පද විචාරය' කෙරෙහි ය. මේ කාණ්ඩය පරිච්ඡේද 6 කින් සමන්විත ය. පළමුවෙනි පරිච්ඡේදය ජීව භාෂාවක ස්වභාවය පැහැදිලි කරමින් සිංහලයේ නව මුහුණුවර හඳුන්වා දෙයි.

'පද' යන භාෂාංගය සදා ගන්නේ 'පදාණු' නමැති භාෂාංගවල සුසංයෝගයෙනි. පදයක් ඇතුළත පදාණු කිහිපයක් වේ නම් ඒ පදාණු සංයෝග කරන අනුපිළිවෙළක් ද ඇත. මේ රීති පද්ධතිය හඳුන්වනු පිණිස 'පදාණු වින්‍යාසය' යන නම භාවිත කරමු.

'පද' යන පදය ඔබට හුරු වුවත් 'පදාණු' යන පදය මඳක් නුහුරු විය හැකි ය. එබැවින් මේ පොතේ දෙවෙනි පරිච්ඡේදය වෙන් වන්නේ 'පදාණු' යන නව සංකල්පය පැහැදිලි කිරීමට ය. විවිධ පදාණු වර්ග එකිනෙකින් වෙන් කොට හඳුනා ගැනීමට මුල් වන ලක්ෂණ මේ ඒකකවල දැක්වෙයි.

පද නිර්මාණයෙහි ලා යොදා ගැනෙන පදාණු වර්ග හතරකි. ප්‍රකෘති, ප්‍රත්‍ය, තද්ධිත හා උපසර්ග යනු විසිනි. පදයක අනිවාර්යයෙන් ම ඇතුළත් වන පදාණු වර්ගය නම් 'ප්‍රකෘති' යි. ප්‍රකෘතියක් නැති තැන පදයක් ද ඇත.

'ප්‍රකෘති' සියල්ල පස් වැදෑරුම් වෙයි. 'නාම' 'ක්‍රියා' 'ගුණ' 'විලාස' හා 'නිපාත' යනුවෙනි. මේ එක් එක් ප්‍රකෘති වර්ගය කෙටියෙන් හඳුන්වා දීම තුන්වෙනි පරිච්ඡේදයේ අරමුණයි.

පද නිර්මාණයෙහි ලා යෙදා ගන්නා දෙවෙනි පදාණු විශේෂය 'ප්‍රත්‍ය' නම් වෙයි. ප්‍රත්‍ය ද විවිධ ය. 'නාම ප්‍රත්‍ය' 'ක්‍රියා ප්‍රත්‍ය' 'ගුණ ප්‍රත්‍ය' 'විලාස ප්‍රත්‍ය' හා 'තද්ධිත ප්‍රත්‍ය' යනුවෙනි. මේ ප්‍රත්‍ය වර්ග සැකෙවින් හඳුන්වා දෙනු පිණිස හතරවෙනි පරිච්ඡේදය වෙන් වෙයි.

'තද්ධිත' යන පදය අර්ථ දෙකකින් මෙහි භාවිත වෙයි. පළමුවෙනි අර්ථය අනුව 'තද්ධිත පදාණුව' යනු ප්‍රකෘතියක් හා ප්‍රත්‍යයක් අතර යෙදෙන පදාණු විශේෂය යි. නාම ප්‍රකෘතියක් හා නාම ප්‍රත්‍යයක් අතර තද්ධිත පදාණුවක් යෙදීමෙන් සැදෙන්නේ 'තද්ධිත නාම පද' යි.

දෙවෙනි අර්ථය අනුව 'තද්ධිත' යනු 'ප්‍රත්‍ය' විශේෂයකි. එය 'තද්ධිත පදාණුවලින්' වෙනස් වන්නේ එක් මූලික ලක්ෂණයක් නිසා ය. තද්ධිත පදාණුවට මුලින් නාම ප්‍රකෘතියක් ද තද්ධිත පදාණුවට පසුව නාම ප්‍රත්‍යයක් ද යෙදෙයි. තද්ධිත ප්‍රත්‍යයට මුලින් නාම ප්‍රත්‍යයක් යෙදුණත් තද්ධිත ප්‍රත්‍යයට පසුව වෙනත් කිසිදු පදාණුවක් නො යෙදෙයි. පස්වෙනි පරිච්ඡේදවය තද්ධිත පදාණු පිළිබඳව ය.

මේ පොතේ හයවෙනි පරිච්ඡේදය වෙන් වන්නේ 'උපසර්ග' නම් පදාණු වර්ගය හඳුන්වා දෙනු පිණිස ය. පැරණි සංස්කෘත ව්‍යාකරණඥයන් 'උපසර්ග' යනුවෙන් ද පද වර්ගයක් දුටුවත් එවැනි පද වර්ගයක් සිංහලයෙහි දක්නට නොලැබෙයි.

මෙහි අවසානයෙහි එන 'සිංහල පදාණු අකාරාදිය' නම් උපග්‍රන්ථය මේ පොතෙහි දක්වා ඇති ප්‍රකෘති පදාණු හැර සෙසු සියලු පදාණු අකාරාදි පිළිවෙළින් ඉදිරිපත් කරයි.

**ජේ.බී.දිසානායක**

2 ඒ පීටර්ස් පෙදෙස
නුගේගොඩ.

(C) Sumitha Publishers

# පටුන


**1. බසක අසිරිය** **7**

1.1 භාෂාව රීති පද්ධතියකි 8

1.2 ලේඛකයෝ : එදා සහ අද 10

1.3 සිංහල රීතිය : එදා සහ අද 12

1.4 පරිණාම ධර්ම : සරලීකරණය 14

1.5 පරිණාම ධර්ම : සුබෝච්චාරණය 16

1.6 පරිණාම ධර්ම : පොදු වැරදි 18

1.7 පරිණාම ධර්ම : කාර්ය මාරුව 24

1.8 සිංහලයේ නව මුහුණුවර 26

1.9 නාමීකරණය 28

1.10 සමකාලීන සිංහල ලේඛකයෝ 34

**2. සිංහල පද නිර්මාණය** **35**

2.1 පදයක නිර්මිතිය 36

2.2 පද ප්‍රභේද 38

2.3 පද වර්ග හඳුනා ගැනීම 40

2.4 ‘පදාණු’ සංකල්පය 42

2.5 අක්ෂර හා පදාණු 44

2.6 පදාණු සංරචක 46

2.7 පදාණු ප්‍රභේද 48

2.8 පදාණුවල ශබ්ද නිර්මිතිය 50

2.9 පදාණු වින්‍යාසය 52

2.10 සමරූපී පදාණු 54

2.11 ස්වාධීන හා අනුබද්ධ පදාණු 56

2.12 ශුන්‍ය පදාණු 58

2.13 ස්වාර්ථ පදාණු 60

2.14 පදාණු සන්ධි 62

2.15 පද හා අනුපද 64

2.16 පදාණු හා අනුපදාණු 66

2.17 නාම පද හා සාධිත නාම පද 68

2.18 ක්‍රියා පද හා සාධිත ක්‍රියා පද 72

2.19 පද සම්භවය 76

2.20 පදාණු පෙළ ගැස්ම 78

**3. ප්‍රකෘති පදාණු විවරණය** **81**

3.1 නාම ප්‍රකෘති හඳුනාගැනීම 82

3.2 නාම ප්‍රකෘති ප්‍රභේද 84

3.3 නාම ප්‍රකෘති ගණ 86

3.4 පුරුෂවාචී නාම ප්‍රකෘති ගණ 88


(C) Sumitha Publishers

3.5 ස්ත්‍රීවාචී නාම ප්‍රකෘති ගණ 92
3.6 අප්‍රාණවාචී නාම ප්‍රකෘති ගණ 94
3.7 ක්‍රියා ප්‍රකෘති 98
3.8 අකර්මක හා සකර්මක ප්‍රකෘති 102
3.9 නිරුත්සාහක ක්‍රියා ප්‍රකෘති 105
3.10 උපකාරක ක්‍රියා ප්‍රකෘති 106
3.11 ගුණ ප්‍රකෘති 107
3.12 තත්සම ගුණ ප්‍රකෘති 108
3.13 තද්භව ගුණ ප්‍රකෘති 110
3.14 විලාස ප්‍රකෘති 112
3.15 නිපාත පද [illegible]

**4. ප්‍රත්‍ය පදාණු විවරණය 125**

4.1 නාම ප්‍රත්‍ය 126
4.2 රූප ප්‍රත්‍ය 128
4.3 උක්ත අනුක්ත භේදය 132
4.4 විභක්ති ප්‍රත්‍ය 136
4.5 ක්‍රියා ප්‍රත්‍ය 144
4.6 ශුද්ධ හා සාධිත ක්‍රියා ප්‍රත්‍ය 146
4.7 උත්තම පුරුෂ ක්‍රියා ප්‍රත්‍ය 148
4.8 මධ්‍යම පුරුෂ ක්‍රියා ප්‍රත්‍ය 150
4.9 ප්‍රථම පුරුෂ ක්‍රියා ප්‍රත්‍ය 153
4.10 අනවසාන ක්‍රියා ප්‍රත්‍ය 156
4.11 ගුණ ප්‍රත්‍ය 162
4.12 ගුණ ප්‍රත්‍ය කෝෂය 164
4.13 විලාස ප්‍රත්‍ය 167
4.14 විලාස ප්‍රත්‍ය කෝෂය 168

**5. තද්ධිත පදාණු විවරණය 173**

5.1 පුරුෂවාචී තද්ධිත 174
5.2 ස්ත්‍රීවාචී තද්ධිත 178
5.3 සන්ධි රීති 182
5.4 බහු තද්ධිත සංයෝග 188
5.5 ගෞරවවාචී තද්ධිත 192
5.6 අප්‍රාණවාචී තද්ධිත 194
5.7 තත්වවාචී තද්ධිත 202
5.8 ක්‍රියාවාචී තද්ධිත 207
5.9 අර්ධ තද්ධිත 210
5.10 ප්‍රයෝජ්‍ය තද්ධිත 214

**6. උපසර්ග පදාණු විවරණය 217**

6.1 උපසර්ග හඳුනා ගැනීම 218
6.2 උපසර්ග : එදා සහ අද 222
6.3 උපසර්ග කෝෂය 226

**සිංහල පදාණු අකාරාදිය** 260

(C) Sumitha Publishers

# කතුවරයාගේ භාෂා පොත්

**භාෂාව**

භාෂාවක රටා සමුදාය
භාෂාවක භාවිතය හා විග්‍රහය
මානව භාෂා ප්‍රවේශය

**සිංහල ව්‍යාකරණය**

සමකාලීන සිංහලය : ශබ්ද විචාරය
නූතන සිංහල ලේඛන ව්‍යාකරණය:
1. අක්ෂර වින්‍යාසය
සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය:
1. ව්‍යාකරණ ප්‍රවේශය
3. සන්ධි විග්‍රහය

සිංහල භාෂාවේ නව මුහුණුවර

සිංහල අක්ෂර විචාරය
අක්ෂර වින්‍යාස ප්‍රවේශය
නණනු ණයනු වින්‍යාසය

**'සිංහල රීතිය' පොත් පෙළ**

සිංහල අක්ෂර මාලාව
සිංහල අක්ෂර හා අක්ෂරාණු
'ණ' කාර වින්‍යාසය
'ළ' කාර වින්‍යාසය
අක්ෂර වින්‍යාසය
පද සන්ධි
පද නිර්මාණය
නාම පද නිර්මාණය

**'පුංචි අපට සිංහල' පොත් පෙළ**

සරල සිංහල හෝඩිය
මිශ්‍ර සිංහල හෝඩිය
මහාප්‍රාණ අක්ෂර
'ණ' යෙදෙන හැටි
'ළ' යෙදෙන හැටි

**'සිංහල ජන වහර' පොත් පෙළ**

සිංහල ජන වහර
ගමක සුවඳ සිව් සිය ගවු ඇසේයා
හඬ වටා පද රටා
සියලඟ රූ සොබා
කිච්චම මොකද
උඩරට සිංහලය

**'අකුරු මිහිර' පොත් පෙළ**

අකුරු මිහිර - 1
අකුරු මිහිර - 2
අකුරු මිහිර - 3
අකුරු මිහිර - 4
අකුරු මිහිර - 5
අකුරු මිහිර වැඩ පොත - 1

**සිංහල භාෂාව පිළිබඳ ඉංග්‍රීසි පොත්**

Language and Commonsense
National Languages of Sri Lanka: 1. Sinhala
Say it in Sinhala
The Structure of Spoken Sinhala:
1. Sounds and Their Patterns
Sinhala : A Unique Indo-Aryan Language
Encyclopaedia of Sinhala Language and Culture
Sinhala-English School Dictionary -1 Simple Adjectives

**'Lets Learn Sinhala' Series**

1. Vowels and Consonants
2. Vowels and Their Strokes
3. Consonants and Their Ways
4. Special Letters and Strokes

(C) Sumitha Publishers

# 1 බසක අසිරිය

**'භාෂාව'** හෙවත් **'බස'** යනු මානව වර්ගයා විසින් මෙතෙක් නිපදවා ගෙන ඇති විශිෂ්ටතම සංස්කෘතික අංගය යි. 'සංස්කෘතිය' යනු මානව වර්ගයා විසින් මෙතෙක් නිපදවා ගෙන ඇති සියල්ල යි. ස්වභාව ධර්මයා විසින් මවන ලද සියල්ල 'ප්‍රකෘතිය' වන අතර ප්‍රකෘතිය හසුරුවා ලීමෙන් මිනිසා මවා ඇති සියල්ල 'සංස්කෘතිය' යි.

සංස්කෘතියෙහි මූලික ම අංගය භාෂාව යි. භාෂාවක් නොවිණි නම් වෙනත් බොහෝ සංස්කෘතික අංග නිර්මාණය කොට ගැනීමට මිනිසාට නුපුළුවන් වනු ඇත. භාෂාවේ උපත මානව ශිෂ්ටාචාරයේ උපතට හේතු විය.

භාෂාව යනු වස්තුවක් නොව **'ශක්‍යතාවක්'** ය. බුද්ධිය මෙහෙයවීමෙන් බිහි වන මේ ශක්‍යතාව ඇත්තේ මානව වර්ගයාට පමණකි. මිනිසා ද සත්වයෙකු වුවත් මිනිසා නමැති සත්වයා වෙනත් සත්ව කොට්ඨාසවලින් වෙන් වන්නේ ඔහුට පමණක් සුවිශේෂී වුණු 'භාෂා ශක්‍යතාව' නිසා ය.

භාෂා ශක්‍යතාව නිසා මිනිසාට කළ හැක්කේ කුමක් ද? මිනිස් සිතෙහි පහළ වන කවර ම අදහසක් හෝ ඒ මොහොතෙහි දී ම ප්‍රකාශ කිරීමට පුළුවන් වීම යි. සතුන් අතර ද 'සන්නිවේදන ශක්‍යතාවක්' ඇතත් එමගින් ඔවුන්ට ප්‍රකාශ කළ හැක්කේ ඔවුන් උපන් දා සිට ම ප්‍රකාශ කරන අදහස් පමණකි. ඔවුහු අලුතින් යමක් ප්‍රකාශ නොකරති.

එහෙත් මිනිසා එසේ නොවෙයි. කලින් නොකී 'අලුත් අදහසක්' පළ කිරීමේ ශක්තිය ඔහු සතු ය. එසේ කිරීමට මිනිසාට හැකි වන්නේ සිය සිතෙහි උපදින අලුත් අලුත් අදහස් ඒ ක්ෂණයෙහි ම ප්‍රකාශ කරනු වස් **'නව වාක්‍ය'** ජනනය කිරීමට ඔහුට හැකි හෙයිනි.

මානව වර්ගයාට පමණක් සුවිශේෂ වූ මේ ශක්‍යතාව නිසා භාෂා දහස් ගණනක් දැන් ලෝ පුරා පහළ වී ඇත. සිංහලය මින් එක් භාෂාවකි. එය උපන්මෙන් අදට අවුරුදු දෙ තුන් දහසකට පමණ උඩ දී ය. එදා සිට අද දක්වා ජීවමානව පැවත එන මේ භාෂාවෙන් සිංහල වර්ගයා බිහි කොට ඇති ලේඛන කලාව විස්මයජනක ය.

(C) Sumitha Publishers

අවුරුදු දෙ දහස් තුන් සියයක් පමණ ඈත අතීතයට දිවෙන අඛණ්ඩ ලේඛන කලාවක් සිංහලයාට ඇත. ලෝකයේ ඇති නිර්මාණාත්මක හෝඩි දාසයෙන් එකක් සේ දැන් පිළිගැනෙන සිංහල හෝඩිය නිර්මාණය කොට ගත් සිංහලයා ඒ අනුසාරයෙන් බිහි කොට ගත් ලේඛන ව්‍යවහාරය ද ඊට ම සුවිශේෂ වූ ලක්ෂණවලින් යුක්ත ය.

**'සිංහල රීතිය'** නමැති මේ පොත් පෙළේ අරමුණ මේ ලක්ෂණ හෙළි පෙහෙළි කොට දී සිංහලයේ අසිරිය විදහා පෑම යි.

# 1.1 භාෂාව රීති පද්ධතියකි

මිනිසාට භාෂා ශක්‍යතාව ලැබෙන්නේ භාෂාව 'රීති පද්ධතියක්' නිසා ය. භාෂාවක ඇත්තේ කිසි යම් ජන කොට්ඨාසයක් විසින් අවුරුදු දහස් ගණනාවක් තිස්සේ සම්මත කොට ගෙන එන 'රීති' සමුදායකි. කුඩා ම දරුවා 'බස තෝරන වියෙහි' පටන් ක්‍රමක්‍රමයෙන් ඉගෙන ගන්නේ මේ 'රීති පද්ධතිය' හඳුනා ගෙන එය තමා සතු කොට ගැනීමට යි.

මානව සමාජයේ යහ පැවැත්මට අවශ්‍ය සාධක දෙකක් වෙයි. 'නීති' හා 'රීති' යනුවෙනි. 'නීති' යනු පාර්ලිමේන්තුව වැනි කිසියම් බලධර මණ්ඩලයක් විසින් 'පනවනු' ලබන්නකි. ඒ රීති සියල්ල කිසියම් 'ආඥා පනතක' ඇතුළත් වෙයි. ඒ නීති 'වගන්ති' හා 'උපවගන්ති' වශයෙන් ඉදිරිපත් කෙරෙයි.

'රීති' යනු බලධර මණ්ඩලයක් විසින් 'පනවනු' ලබන්නක් නොවේ. ඒවා බිහි වන්නේ සමාජයේ පොදු සම්මතයෙන් ම ය. 'සමාජ සම්මතය' යනු සමාජයේ හැම දෙනාගේ ම හෝ වැඩි දෙනාගේ හෝ පොදු එකඟතාව යි. භාෂාවක් සැදෙන්නේ මෙවන් රීති පද්ධතියකිනි.

නීති කලින් කලට වෙනස් කරනු ලබේ. සමාජයේ නව අවශ්‍යතා අනුව ය. රීති ද කලින් කලට වෙනස් වෙයි. සමාජයෙහි වෙනස් වන ඕනෑ එපාකම් අනුව ය. භාෂාවේ රීති ද කලින් කලට වෙනස් වෙමින් පරිණාමය වෙයි.

අනුරාධපුර යුගයෙහි විසූ ලේඛකයන් භාවිත කළ භාෂා රීති සමහරක් අද භාවිත නොවේ. අද භාවිත වන සමහර රීති අනාගතයෙහි දී වෙනස් වනු ඇත.

නීතියක් බින්දොත් දඬුවමක් ලැබේ. ඒ දඬුවම ලැබෙන්නේ උසාවියෙනි. එය ක්‍රියාත්මක කරන්නේ පොලිසිය යි. රීතියක් බින්ද විට ද දඬුවමක් ලැබෙයි. එහෙත් ඒ උසාවියෙන් නොව පොදු සමාජයෙන් ම ය.

භාෂාවක් සතු 'රීති පද්ධතිය' හඳුන්වන්ට **'ව්‍යාකරණය'** හා **'වියරණය'** යන පද යෙදේ. 'ව්‍යාකරණ' යනු සංස්කෘත භාෂාවෙන් ගත් 'තත්සම' පදයකි. 'වියරණය' එයින් බිඳ ගත් 'තද්භවයකි'.

අද ලෝකය පුරා භාවිත වන භාෂා හත් දහස් ගණනකි. ඒ භාෂා හැඳින්වෙන්නේ 'ජීව භාෂා' හෝ 'ජීවමාන භාෂා' යනුවෙනි. ජීව භාෂා යොදා ගන්නේ එදිනෙදා සන්නිවේදනය සඳහා ය. එවැනි ජීව භාෂා තුනක් එදිනෙදා සන්නිවේදනය සඳහා අද මේ රටේ භාවිත වෙයි. ඒ සිංහලය, දෙමළ හා ඉංග්‍රීසිය යි.

'ජීව භාෂාව' ජීවියෙකු වැන්න. ජීවියා මොහොතින් මොහොත වෙනස් වෙයි. වෙනස් වන පරිසරයට ගැළපෙන පරිද්දෙනි. වෙනස් වන පරිසරයට ගැළපෙන සේ වෙනස් වීමට අසමත් වන ජීවියා වඳ වී යයි. එසේ ම ජීව භාෂාව ද මොහොතින් මොහොත වෙනස් වෙමින් සමාජයේ අවශ්‍යතා පිරිමසා ලයි.

(C) Sumitha Publishers

# ‘සිංහල රීතිය’ පොත් පෙළ

## මෙතෙක් පළ වී ඇති කාණ්ඩ













(C) Sumitha Publishers













**සුමිත ප්‍රකාශකයෝ**
info@sumithabooks.com : www.sumithabooks.com
0777809676

(C) Sumitha Publishers